**ANNEX I**

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
**උසස් අධ්‍යාපන අංශය**
உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு
உயர் கல்விப் பிரிவு
MINISTRY OF HIGHER EDUCATION & HIGHWAYS
**HIGHER EDUCATION DIVISION**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | HE/EST/02/UTUJC | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2016.08.23 |

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කිරීම - 2016**

2016 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහ විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා දැනට ක්‍රියාත්මක වන වැටුප් පරිමාණයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණයන් 2016.01.01 දින සිට අදියර 05 කින් උපලේඛන II හි සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

02. ඒ අනුව අදාල වැටුප් පරිවර්තනයන් සඳහා උපයෝගී කරගනු පිණිස 2016.08.18 දාතම කළමනාකරණ සේවා චක්‍රලේඛ 04/2016 හි පිටපතක් පිටු 7 කින් යුක්තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වන වැටුප් ව්‍යුහය - 2016 පිටුව I සිට XLIII දක්වාද වැටුප් පරිවර්තන ලිපි ආදර්ශ, ඇමුණුම I සිට ඇමුණුම V දක්වාද මේ සමඟ එවා ඇත.

03. ඒ අනුව අදාල වැටුප් පරිවර්තනය සිදුකිරීමට මින් අනුමැතිය දෙමි. මේ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා යථෝක්ත චක්‍රලේඛයේ 19.1 පරිදි ක්‍රියාකරන්නේ නම් මැනවි.

පී.ජී.ජයසිංහ
අතිරේක ලේකම් (පාලන හා මුදල්)

අත්:කලේ/ ඩී.සී.දිසානායක
ලේකම්
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය